# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2318/76 - 2023 පෙබරවාරි මස 11 වැනි සෙනසුරාදා - 2023.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ**

**(4) වන උප වගන්තිය යටතේ වූ නියමය**

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධි විධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (4) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එවකට ඉඩම් අමාත්‍ය ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා විසින් අංක 1939/16 හා 2015 නොවැම්බර් 04 දිනැති රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකිරීම මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පවරා ගෙන ඇති මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මඩවල උල්පත E322C ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ පිහිටි නාලන්දා වත්තට අදාළ *ගැසට් පත්‍රයේ* දෙවන උපලේඛනයේ දකුණු මායිමට අදාළව සඳහන් කර ඇති "ප්‍රධාන මාර්ගය" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "මාර්ගය" යන වචනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

**හරීන් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 ජනවාරි මස 27 වන දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහලේකම් කාර්යාලය,
මිහිකත මැදුර,
1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

EOG 02 - 0129